// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2095/19 - 2018 නොවැම්බර් මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2018.11.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ පනවනු ලබන නියමය

2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත උපලේඛනයේ I වන සහ II වන තීරුවල සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය යටතේ සඳහන් කරනු ලැබ ඇති භාණ්ඩ ආනයනකර සැපයීම මත, එම උපලේඛනයේ III වන තීරුවේ ඊට අනුරූපීව සඳහන් කර ඇති නිශ්චිත අනුප්‍රමාණය අනුව එකතු කළ අගය මත බදු ගෙවිය යුතු බව මෙම නියමය මගින් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍ය.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

| *සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංකය* I | *විස්තරය* II | *බදු අනුප්‍රමාණය* III |
|---|---|---|
| 44.07 | දික් අතට ඉරූ හෝ පැලූ කුට්ටි කළ හෝ පිටපොත්ත හරින ලද, යතු ගෑවා වූ හෝ වැලි කඩදාසි ඇල්ලුවා වූ හෝ අන්ත මූට්ටු කළා වූ (එන්ඩ් ජොයින්ට්ස්) හෝ එසේ නොකළා වූ මි. මී. 6 කට වැඩියෙන් ඝනකමක් ඇති දැව. | 5% |
| 44.08 | තුනී ලෑලි හෝ ඒ හා සමාන ආස්තරනය කළ ලෑලි සහ අනෙකුත් ලෑලි විනිරිං කිරීම සඳහා දික් අතට ඉරූ, කුට්ටි කළ හෝ පිටපොත්ත හරින ලද, යතු ගෑම, වැලි කඩදාසි ඇල්ලීම, පිරිද්දීම, හෝ අන්ත මූට්ටු කිරීම කළ හෝ නොකළ මි. මී. 6 ක් නොඉක්මවන ඝනකම ඇති (ආස්තරනයකළ දැව පෙති ගැසීමෙන් ලබාගත් ඒවා ද ඇතුළුව), අනෙකුත් ලෑලි තහඩු. | 5% |

11 - 773

1A - PG 4303 — 557 (2018/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*